*සැ. යු.*- 2013.12.27 දින පළ වූ අංක 1,843 දරන *ගැසට් පත්‍රයේ* I:III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,844 - 2014 ජනවාරි මස 03 වැනි සිකුරාදා - 2014.01.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 3 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | – |

*සැ. යු.*- තාක්ෂණ සහ සමාජ සේවා වැඩි දියුණු කිරීම සඳහා අධ්‍යාපන මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 දෙසැම්බර් මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජනවාරි මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජනවාරි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1- B 80798—2,950 (2014/01)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

### පොලිස් කොස්තාපල් තනතුර (විශේෂ කාර්ය බලකාය)

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ විශේෂ කාර්ය බලකායට සෘජුවම බඳවා ගැනීම සඳහා ආධුනික පොලිස් කොස්තාපල් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කාර්යාලය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ උඩින් තමා අයදුම් කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2014.01.31 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර පොලිස් දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 1,71,360 - 7 x 1,740 - 10 x 2,160 - 17 x 2,880 - රු. 2,54,100

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ලැබේ.

(*අ*) දුෂ්කර දීමනා:— රු. 2,000

(*ආ*) *සංයුක්ත දීමනා:*—
(1) උතුරු සහ නැගෙනහිර සේවය සඳහා රු. 10,500
(2) අනෙකුත් ප්‍රදේශවල සේවය සඳහා රු. 8,400

(*ඇ*) *වෙනත් දීමනා:*—

(1) නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව රු. 250
(2) සිවිල් ඇඳුම් දීමනාව රු. 200
(3) දිරි දීමනාව රු. 1,500
(4) ආරම්භක වැටුපෙන් 25% වන දීමනාව

(*අ*) නොමිලේ ගමන් පහසුකම්,

(*ආ*) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුව ද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක.)

(*ඇ*) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(*ඈ*) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(*ඉ*) රාජකාරි සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :—

(*අ*) *වයස් සීමාව* :
*ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට* වයස අවුරුදු 18-25 ත් අතර විය යුතු ය. එසේ වුව ද දැනට පොලිස් ආරක්ෂක සහායක සේවාවේ නියුතු නිලධාරීන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයදුම්කළ හැක.

(*ආ*) *අධ්‍යාපන සුදුසුකම්* :

* අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුලුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සමත් විය යුතු ය. වාර දෙකක දී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේ දී විෂයයන් 05ක් සමත් විය යුතු ය.

*සටහන 01*:- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂයය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂයය යුගලය එක් විෂයයක් වශයෙන් ද, සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02* :- අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03*:- වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(*ඇ*) *ශාරීරික සුදුසුකම්* :

- *උස අඩි 05 යි. අඟල් 04 යි. (අවම),*
- පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා).

*සටහන* :- විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගී වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවකුගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(*ඉ*) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්* .— එක් ඇසක දෘෂ්ටිය 6/12 අඩු නොවිය යුතු ය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතු ය. යම් අපේක්ෂකයකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(*ඊ*) *අනෙක් සුදුසුකම්* :

- අයදුම්කරු අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන් ද මේ සඳහා විවාහකයින් ලෙස සැලකේ.) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කරන පොලිස් ආරක්ෂක සහායක නිලධාරීන්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :-

- අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය හෙවත් ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

1. මීටර් 1,000 - මිනිත්තු 03, තත්පර 44.

* යෝග්‍යතා පරීක්ෂණයෙන් හෝ දරාගැනීමේ පරීක්ෂාව සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

* ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,

- *වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය.*—කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතු ය.
- *සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය.*—කාලය පැය 01 යි.

06. *වෛද්‍ය පරීක්ෂණය* :

- ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලබන අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. *පසුබිම් පරීක්ෂාව* :

(*අ*) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(*ආ*) බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* :

- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.
- 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරි තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.
- පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

09. *පත්වීමේ කොන්දේසි* :

* මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

10. *සේවා කොන්දේසි* :

(*අ*) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(*ආ*) තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වේතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(*ඇ*) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙලුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වේතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(*ඈ*) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියකුම නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණවලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(*ඉ*) පත්කර ගනු ලැබූ නිලධාරීන් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් ගැසට් II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(*ඊ*) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක පරිවාස සේවා කාලයක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කළ යුතු වන අතර මෙම පරිවාස සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා හා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේ දී ම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වන වෙලුමෙහි ආයතන සංග්‍රහයේ 5 වන පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.

(*උ*) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පොලිස් පුහුණු අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු ය.

(ඌ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පොලිස් පුහුණු අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(එ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පොලිස් දෙපාර්තමේන්තුවේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. (අ) මෙම ගැසට් පත්‍රයේ I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය.) :-

(අ) උප්පැන්න සහතිකය;

(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන);

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික;

(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂයය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික;

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික,(තිබේ නම් පමණක්);

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් යා කළ යුතු ය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත්, අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කරනු ලැබූ අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.*

*පොලිස්පති.*

*පොලිස් දෙපාර්තමේන්තුව*

*ආධුනික පොලිස් කොස්තාපල් තනතුර (විශේෂ කාර්ය බලකාය)*

*ආදර්ශ අයදුම්පත්‍රය*

01. (අ) සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතු ය. :———.

(ආ) නම (මුලකුරු සමග) :———.

(ඇ) අයදුම් කරන තනතුර :———.

02. ජාතික හැඳුනුම්පත් අංකය :———.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඇමිණිය යුතු ය.)

03. පියාගේ සම්පූර්ණ නම :———.

04. අයදුම්කරු උපන් ස්ථානය :———.

උපන් ස්ථානයට අදාළ පොලිස් ස්ථානය :———.
පළාත :———.

05. (අ) වර්තමාන ලිපිනය :———.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඇ) ස්ථිර ලිපිනය :———.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඉ) ස්ථිර ලිපිනයට අදාළ මැතිවරණ කොට්ඨාසය :———.
(ඊ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :———.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———.
(උ) දුරකථන අංකය - නිවස :———. ජංගම :———.

06. (අ) ජාතිය :———.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :———.

(ඇ) ඔබ පුරවැසියකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :———.
* අයදුම්කරු :———.
* අයදුම්කරුගේ පියා :———.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :———.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :———.

07. උපන් දිනය :———. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)

වයස :— (ගැසට් නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කරන දිනට)

අවුරුදු :———. මාස :———. දින :———.

08. උස : අඩි :———. අඟල් :———., පපුව :අඟල් :———.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතික වල පිටපත් ඇමිණිය යුතු ය) :———.

10. අතිරේක සුදුසුකම් :———. (සහතිකපතේ ඡායා පිටපතක් ඇමිණිය යුතු ය)

11. විවාහක/අවිවාහක බව :———.

12. (අ) දැනට කරන රැකියාව :———.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :———.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් සහ/හෝ සුදුසුකම් තිබේ ද ? :———.

14. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :
(අ) ———,
(ආ) ———.

15. (අ) ඔබ පොලිස් උපසේවයේ හෝ නිත්‍ය පොලිස් සේවාවේ තනතුරක් සඳහා මීට පෙර ඉල්ලුම් කර තිබේ ද ? :———.

(එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න) :———.

(ආ) ඔබ මීට පෙර නිත්‍ය පොලිස් සේවයේ හෝ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සේවය කර තිබේ ද ? :———.

එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :———.

16. ඔබ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සාමාජිකයෙක් ද ? (එසේ නම් පත්වීමේ දිනය, නිලය, නිල අංකය සඳහන් කරන්න). පත්වීමේ ලිපියේ පිටපතක් අමුණන්න. :———.

17. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. :———.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

18. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය :———.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

19. ඔබ කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ?

(එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

20. ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක් වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

12-49/2

---

## ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

### පොලිස් කොස්තාපල් රියදුරු තනතුර - විශේෂ කාර්ය බලකාය

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ විශේෂ කාර්ය බලකායේ ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් "අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කාර්යාලය, අංක 375, පළමු මහල, හැව්ලොක් පාර, කොළඹ 06," යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2014.01.31 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැළැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර පොලිස් දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය :*

රු. 1,71,360 - 7 x 1,740 - 10 x 2,160 - 17 x 2,880 - රු. 2,54,100

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ලැබේ.

| | |
|---|---|
| (අ) දුෂ්කර දීමනා සඳහා | රු. 2,000 |
| (ආ) *සංයුක්ත දීමනා :* | |
| (1) උතුරු සහ නැගෙනහිර සේවය සඳහා | රු. 10,500 |
| (2) අනෙකුත් ප්‍රදේශවල සේවය සඳහා | රු. 8,400 |
| (ඇ) *වෙනත් දීමනා :* | |
| (1) නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව | රු. 250 |
| (2) සිවිල් ඇඳුම් දීමනාව | රු. 200 |
| (3) දිරි දීමනාව | රු. 1,500 |
| (4) ආරම්භක වැටුපෙන් 25% වන දීමනාව | |

(අ) නොමිලේ ගමන් පහසුකම්,

(ආ) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම්, (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක.)

(ඇ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ,

(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්,

(ඉ) රාජකාරී සඳහා ගමන් වියදම් දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරී සඳහා තෑගි වශයෙන් මුදල් ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම් :*

(අ) *වයස් සීමාව :*
*ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට* වයස අවුරුදු 19-26 ත් අතර විය යුතු ය. එසේ වුවද දැනට පොලිස් ආරක්ෂක සහයක සේවාවේ නියුතු නිලධාරීන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයදුම්කළ හැක.

(ආ) *අධ්‍යාපන සුදුසුකම් :*

* අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සමත් විය යුතු ය. වාර දෙකක දී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේදී විෂයයන් 05ක් සමත් විය යුතු ය.

*සටහන 01 :* ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂයය යුගලය එක් විෂයයක් වශයෙන් ද, සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02 :* අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03 :* වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

පහත සඳහන් සුදුසුකම් සපුරනු ලබන පොලිස් කොස්තාපල් රියදුරු අයදුම්කරුවන් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

* රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් පූර්ණ කාලීනව වසර 03ක මෝටර් කාර්මික පාඨමාලාව හදාරා තිබීම හා එම ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්ද,

(ඇ) *ශාරීරික සුදුසුකම් :*

* උස අඩි 05 අඟල් 03 (අවම),
* පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා),

*සටහන.-* විශිෂ්ඨ ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ඨත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගී වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවෙකුගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුවද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඈ) *වෘත්තීය සුදුසුකම් :*

* සැහැල්ලු මෝටර් රථ හෝ බර වාහන පැදවීමේ ප්‍රවීනතා සහතිකය ලබා තිබීම.

* ඉහත බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් අවුරුදු 01ක මෝටර් රථ පැදවීමේ පළපුරුද්දක් තිබිය යුතු ය.

*සටහන.*—මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ දැනීම, මෝටර් රථ අළුත්වැඩියාව පිළිබඳ පළපුරුද්ද, රිය පැදවීම දිගුකාලීන පළපුරුද්ද සඳහා ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

* රිය පැදවීමේ දක්ෂතාව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන ශාරීරික අවයවයන් හැසිරවීමට බාධා ඇති කරන යම්කිසි අංගවිකලත්වයකින් හෝ වෙනත් ශාරීරික ආබාධයකින් පෙළෙන කිසියම් අපේක්ෂකයකු වෙතොත් එම අපේක්ෂකයා සේවයට සුදුසු බවට වෛද්‍ය සහතිකයක් ලබා තිබුණත්, ඔහු නුසුදුස්සෙකු වනු ඇත.

* මූලික සුදුසුකම් තිබෙන අයදුම්කරුවන් වාහන පැදවීම හා නඩත්තු කිරීමේ හැකියාව පිළිබඳ පරීක්‍ෂා කරනු ලැබේ. එමෙන්ම මාර්ග නීති, රථ වාහන සංඥා ක්‍රම පිළිබඳ අපේක්ෂකයන් බා ඇති දැනුමත්, එක් එක් අපේක්ෂකයා පැදවීමට නිපුනත්වය ලබා ඇති වාහනයෙහි යාන්ත්‍රික සිද්ධාන්තයන් පිළිබඳ මූලික දැනුමක් පරීක්‍ෂා කරනු ලැබේ.

(ඉ) *දෘෂ්ඨිය පිළිබඳ අවශ්‍යතාවයන් .*— එක් ඇසක දෘෂ්ඨිය 6/12 අඩු නොවිය යුතු ය. දෘෂ්ඨිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ඨිය සාමාන්‍ය විය යුතු ය. යම් අපේක්ෂකයෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඊ) *අනෙක් සුදුසුකම් :*

* අයදුම්කරු අවිවාහක විය යුතු ය. (දික්කසාද වුවන් ද මේ සඳහා විවාහකයින් ලෙස සැලකේ.) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කරන පොලිස් ආරක්‍ෂක සහායක නිලධාරීන්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :*

* අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය හෙවත් ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

1. මීටර් 1,000 - මිනිත්තු 03, තත්පර 14.

* යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

06. *වෘත්තීයමය සුදුසුකම්* :

6.1 වෘත්තීයමය පරීක්‍ෂණ පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්‍ෂකගේ අධීක්‍ෂණය යටතේ පොලිස් රියදුරු පාසලේ සහකාර අධ්‍යක්‍ෂ විසිනි.

6.2 වෘත්තීයමය පරීක්‍ෂණය සඳහා ලකුණු 100ක් වෙන් කර ඇත. මෙම වෘත්තීයමය පරීක්‍ෂණය පහත පරිදි සමන්විත වේ.

| | | |
|---|---|---|
| (අ) | රිය පැදවීමේ ප්‍රවීනතාවය | ලකුණු 50 |
| (ආ) | මාර්ග නීති උපදේශක සංග්‍රහය | ලකුණු 25 |
| (ඇ) | වාහන නඩත්තු කිරීම සහ සුලු අලුත්වැඩියාවන් පිළිබඳ දැනීම | ලකුණු 25 |

6.3 වෘත්තීයමය පරීක්‍ෂණය රිය පැදවීමේ ප්‍රවීනත්වය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 50න් අවම වශයෙන් ලකුණු 25ක් හා මාර්ග නීති උපදේශක සංග්‍රහය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 25න් අවම වශයෙන් ලකුණු 12.5ක් සහ වාහන නඩත්තු කිරීම හා සුලු අලුත්වැඩියාවන් සම්බන්ධ දැනුම සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 25න් අවම වශයෙන් ලකුණු 12.5ක් ද ලබා ගෙන වෘත්තීයමය පරීක්ෂණ සඳහා වෙන්කර ඇති මුලු ලකුණු 100න් ලකුණු 50ක් අවම වශයෙන් ලබා ගෙන ඇති අයදුම්කරුවන් වෘත්තීයමය පරීක්‍ෂණය සමත් වූ ලෙස සලකනු ලැබේ. වෘත්තීයමය පරීක්‍ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් වෛද්‍ය පරීක්‍ෂණයට කැඳවනු ලැබේ.

සටහන.-බඳවා ගනු ලබන පොලිස් කොස්තාපල් රියදුරන් පරිවාස කාලය අවසන් වීමට ප්‍රථම බර වාහන පැදවීමේ ප්‍රවීනතා සහතිකය ලබා ගෙන පොලිස් විද්‍යාලය මගින් පවත්වනු ලබන බර වාහන පැදවීමේ පරීක්‍ෂණයෙන් සමත් විය යුතු ය.

07. *වෛද්‍ය පරීක්ෂණය* :

* ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලබන අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. *පසුබිම් පරීක්ෂණය* :

(අ) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

09. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* :

* රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.

* 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරි තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

* පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

10. *පත්වීමේ කොන්දේසි* :

* මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

11. *සේවා කොන්දේසි* :

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙලුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙකුම නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණවලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරීන් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් ගැසට් II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක පරිවාස සේවා කාලයක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කළ යුතු වන අතර මෙම පරිවාස සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම්, ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙලුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.

(උ) ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු ය.

(ඌ) ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(එ) ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන්, පොලිස් දෙපාර්තමේන්තුවේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

12. (අ) මෙම ගැසට් පත්‍රයේ I කොටස (II අ) වන ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

13. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය.) :-

(අ) උප්පැන්න සහතිකය;

(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන);

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික;

(ඈ) විශේෂ වාර්ථා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික;

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික,(තිබේ නම් පමණක්);

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්;

(උ) රියදුරු බලපත්‍රයෙහි ඡායා පිටපතක්.

14. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් යා කළ යුතු ය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත්, අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කරනු ලැබූ අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

15. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.*

*වැඩ බලන පොලිස්පති.*
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

*පොලිස් දෙපාර්තමේන්තුව*

*ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර (විශේෂ කාර්ය බලකාය)*

*ආදර්ශ අයදුම්පත්‍රය*

01. (අ) සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතු ය. :———.

(ආ) නම (මුලකුරු සමග) :———.

(ඇ) අයදුම් කරන තනතුර :———.

02. ජාතික හැඳුනුම්පත් අංකය :———.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඇමිණිය යුතු ය.)

03. පියාගේ සම්පූර්ණ නම :———.

04. අයදුම්කරු උපන් ස්ථානය :———.

උපන් ස්ථානයට අදාළ පොලිස් ස්ථානය :———.
පළාත :———.

05. (අ) වර්තමාන ලිපිනය :———.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඇ) ස්ථිර ලිපිනය :———.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඉ) ස්ථිර ලිපිනයට අදාළ මැතිවරණ කොට්ඨාසය :———.
(ඊ) ස්ථිර ලිපිනයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———.
(උ) දුරකතන අංකය - නිවස :———. ජංගම :———.

06. (අ) ජාතිය :———.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :———.

(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :———.
අයදුම්කරු :———.
අයදුම්කරුගේ පියා :———.
අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :———.
අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :———.

07. උපන් දිනය :———. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)

වයස :— (ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)

අවුරුදු :———. මාස :———. දින :———.

08. උස : අඩි :———. අඟල් :———. පපුව : අඟල් :———.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතික වල පිටපත් ඇමිණිය යුතු ය) :———.

10. (අ) රියදුරු බලපත්‍ර අංකය :———.
(ආ) රියදුරු බලපත්‍රය ලබාගත් දිනය :———.

(ඇ) ප්‍රවීණතාවය ලබා ඇති වාහන පංතිය :————.
(රියදුරු බලපත්‍රයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය)

11. අතිරේක සුදුසුකම් :————. (සහතිකපතේ ඡායා පිටපතක් ඇමිණිය යුතු ය)

12. විවාහක/අවිවාහක බව :————.

13. (අ) දැනට කරන රැකියාව :————.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :————.

14. ඔබට විශේෂ දක්ෂතාවයන් සහ/හෝ සුදුසුකම් තිබේ ද ? :————.

15. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :
(අ) ————,
(ආ) ————.

16. (අ) ඔබ පොලිස් උප සේවයේ හෝ නිත්‍ය පොලිස් සේවාවේ තනතුරක් සඳහා මීට පෙර ඉල්ලුම් කර තිබේ ද ? :————.

(එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න) :————.

(ආ) ඔබ මීට පෙර නිත්‍ය පොලිස් සේවයේ හෝ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සේවය කර තිබේ ද ? :————.

එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :————.

17. ඔබ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සාමාජිකයෙක් ද ? (එසේ නම් පත්වීමේ දිනය, නිලය, නිල අංකය සඳහන් කරන්න). පත්වීමේ ලිපියේ පිටපතක් අමුණන්න. :————.

18. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. :————.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :————.

19. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය :————.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :————.

20. ඔබ කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ?

(එසේ නම් විස්තර සඳහන් කරන්න) :————.

21. ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක් වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

01-49/1

---

## වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර තනතුර

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, ඉංජිනේරු සහකාර සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

මීට යාකර ඇති අයදුම් පත්‍ර අනුව පිළියෙල කරන ලද අයදුම් පත් 2014.01.24 වැනි දින හෝ ඊට පෙරාතුව ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් කොළඹ 07, අංක 230, බෞද්ධාලෝක මාවතේ වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ එවිය යුතු ය.

මෙම දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත බහාලන ලියුම් කවරයේ උඩ වම්පස කෙළවරේ "වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර තනතුර " යනුවෙන් සඳහන් කළ යුතු ය.

2. *වැටුප් ක්‍රමය.*—පුහුණුවීම් කාලය සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු මෙම තනතුර සඳහා මාසික ඒකාබද්ධ වැටුප් පරිමාණය රු. 15,005-4x180 -14x240-19,085 වේ. (රු.16,205ට වාර්ෂික වැටුප් පියවරට පූර්වයෙන් කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් ඇත.)

3. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය;

(ආ) 2014.01.24 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 30ට වැඩි නොවිය යුතුය. ( පළාත් හා රාජ්‍ය සේවයේ නියුතු සේවකයින් කෙරෙහි ඉහළ වයස් සීමාව බලපාන්නේ නැත.) ;

(ඇ) මනා චරිතයකින් යුක්ත විය යුතුය;

(ඈ) යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුතු අයෙකු විය යුතු ය. ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු බවට රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කළ හැකි වන පරිදි වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීම අවශ්‍යය ;

(ඉ) පහත සදහන් I, II, III, IV යටතේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් වලින් එකක් ලබා තිබිය යුතු ය ;

(i) භාෂාව, ගණිතය, ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව සහ තවත් එක් විෂයයකින් සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම; සමඟ

භෞතික විද්‍යාව හා ශුද්ධ ගණිතය ඇතුලුව අවම වශයෙන් විෂයයන් හතරකින් (04) සාමාන්‍ය සාමාර්ථයන් සහිතව එක් වරක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත්වීම;

හෝ

නව නිර්දේශ අනුව භෞතික විද්‍යාව හා සංයුක්ත ගණිතය ඇතුලුව විෂයයන් තුනකින් (03) සාමාන්‍ය සාමාර්ථයන් සහිතව එක් වරක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත්වීම;

(ii) එක් අවුරුද්දක ප්‍රයෝගික (ක්ෂේත්‍ර) පුහුණුවක් සහිතව මොරටුව විශ්ව විද්‍යාලයෙන් හෝ අම්පාර හාඩි කාර්මික විද්‍යාලයෙන් තාක්ෂණය පිළිබඳව ජාතික ඩිප්ලෝමා සහතිකය (සිවිල් ඉංජිනේරු) ලැබ සිටිය යුතු අතර, මැනීම හා මට්ටම් ගැනීම සහ වාරිමාර්ග ඉංජිනේරු විද්‍යාව යන විෂයයන් ද ඇතුළත්ව අදාළ විභාගය සමත් වී තිබිය යුතු ය.

(iii) මට්ටක්කුලිය උසස් තාක්ෂණික ආයතනයෙන් වාරිමාර්ග ඉංජිනේරු විද්‍යාව හා මිනුම් හා මට්ටම් ගැනීම යන විෂයන් ද ඇතුළත්ව සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළව උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

(iv) කටුනායක ඉංජිනේරු තාක්ෂණික ආයතනයෙන් වාරිමාර්ග ඉංජිනේරු විද්‍යාව හා මිනුම් හා මට්ටම් ගැනීම යන විෂයන් ද ඇතුළත්ව සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළව ජාතික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

සටහන.- පාඨමාලාව සම්පූර්ණ කර ඇති එහෙත් සහතිකය ලබා නොමැති අයදුම්කරුවන්ට ද අයදුම් කල හැකි අතර, ඔවුන් එකී සහතිකය සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. නමුත් සහතිකයේ බලාත්මක දිනය ඉල්ලුම් පත් කැඳවීමේ අවසාන දිනට පෙර විය යුතු ය.

4. බඳවාගැනීමේ ක්‍රමය :

(අ) සියලුම බඳවා ගැනීම් අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාර සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව සිදු කෙරෙනු ඇත.

(ආ) (i) ඉහත 3.ඉ. I යටතේ සඳහන් සුදුසුකම් සහිතව බඳවා ගන්නා ලද ආධුනිකයින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගල්ගමුව අභ්‍යාස ආයතනයේ නේවාසිකව වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන පූර්ණ කාලීන පාඨමාලාව දෑවුරුදු කාල සීමාවක් තුළ හැදෑරිය යුතු ය. එහි දී අවසාන ලිඛිත පරීක්ෂණය ඇතුලුව නියමිත විභාගවලින් සමත්වන අභ්‍යාසලාභින් එක් අවුරුදු ප්‍රායෝගික පුහුණුවක් සඳහා ක්ෂේත්‍රයට අනුයුක්ත කරනු ඇත. වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් සෑහීමකට පත්වනසේ සතුටුදායක ලෙස එම ක්ෂේත්‍ර පුහුණුව නිම කිරීමෙන් පසුව පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත්වන ආධුනිකයින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අභ්‍යාස ආයතනය මඟින් පිරිනමනු ලබන වාරිමාර්ග ඉංජිනේරුමය ඩිප්ලෝමා සහතිකය ලැබීමට සුදුසුකම් ලබති.

(ii) නියමිත විභාගවලින් අසමත්වන වාරිමාර්ග ආධුනිකයින්ට එසේ අසමත් වූයේ වැඩ කටයුතු පැහැරහැරීම, උනන්දුව නැතිවීම හෝ අයහපත් පැමිණීම නිසා නොවේ නම්, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි ඔවුන්ගේ පුහුණුව මාස හයකට නොවැඩි කාල පරිච්ඡේදයකින් දීර්ඝ කරවා ගැනීමට ඉඩ ප්‍රස්ථාව ඇත. අසමත් වූ ආධුනිකයින් එසේ දීර්ඝ කරන ලද පුහුණුවීමේ කාල පරිච්ඡේදය අවසානයේ දී ඔවුන් සඳහා පවත්වන අවසාන විභාගය ඇතුළු නියමිත විභාග සියල්ලෙන්ම සමත්විය යුතු ය. එම විභාගය ද අසමත් වන ආධුනිකයින්ගේ සේවය අවසන් කරනු ලැබේ.

(iii) පුහුණුව ලබන කාලය තුළ දී ආධුනිකයින් යටත් පිරිසෙයින් දේශනවලින් 80%කටවත් සහභාගි වී සතුටුදායක පුහුණුවීම් වාර්තාවක් ඉදිරිපත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. අවශ්‍ය අවම පැමිණීම හා සතුටුදායක පුහුණුවීමේ වාර්තාවක් නැති යම්කිසි ආධුනිකයෙක් වෙතොත් නියමිත විභාගයට පෙනී සිටීමට ඉඩ නොදෙන අතර, පුහුණුව ද අවසන් කරනු ලැබේ.

(iv) ඉහත 3.ඉ.II, III, IV යටතේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිතව බඳවා ගන්නා ලද ආධුනිකයින් දේශන හා ප්‍රායෝගික පුහුණුව ද ඇතුළත් වන සේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන හය මසක පුහුණුවකින් පසුව පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

(v) මෙම අභ්‍යාසලාභීන් ලබා ඇති එක් වසරක ක්ෂේත්‍ර පුහුණුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව තුළ සාර්ථකව ලබා ගෙන ඇත්නම්, බඳවා ගැනීමෙන් පසුව ආධුනිකයින් ලැබිය යුතු හය (6) මසක පුහුණුවීමේ කාල සීමාවෙන් නිදහස් කරනු ලබන අතර, ඔවුන් සියළුදෙනාම ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිට සමත් විය යුතු ය.

(ඇ) සියලු දේශන හා පුහුණු පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

(ඈ) පුහුණුව සාර්ථකව අවසාන කරන අය වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර තනතුරට පත් කරනු ලැබේ.

5. සේවා කොන්දේසි :

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අය කර ගනු ලැබේ.

(ආ) අයදුම්කරුවන් ප්‍රථම වශයෙන් වාරිමාර්ග ආධුනිකයන් වශයෙන් බඳවා ගැනේ.

(ඇ) වාරිමාර්ග ආධුනිකයින් සඳහා පුහුණුව ලබන කාල සීමාව තුළ දෙනු ලබන දීමනාවන් - 3.ඉ.I සුදුසුකම් සහිතව බඳවා ගනු ලැබූ වාරිමාර්ග ආධුනිකයින් හට පුහුණුව ලබන සම්පූර්ණ කාලය තුළ දී පහත සඳහන් පරිදි දීමනාවන් ගෙවනු ලැබේ.

පළමු වසර සඳහා මසකට රු. 12,920 බැගින් ;
දෙවන වසර සඳහා මසකට රු. 13,040 බැගින් ;
තුන්වන වසර සඳහා මසකට රු. 13,160 බැගින් ;

3.ඉ.II, III, IV සුදුසුකම් සහිතව බඳවා ගන්නා ලද ආධුනිකයින්හට ඔවුන්ගේ හය මසක පුහුණු කාලය තුළදී මසකට රු. 13,160 බැගින් දීමනාවක් ගෙවනු ලැබේ.

මෙම දීමනාව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ අවසරය පරිදි දීර්ඝ කරනු ලබන පුහුණුවීමේ කාල පරිච්ඡේදයෙහි දී ලැබීමට හිමිකම් ඇත. වෙනත් වරප්‍රසාද හෝ හිමිකම් කිසිවක් නොලැබේ.

(ඈ) වාරිමාර්ග ආධුනිකයින් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට හා රජය මඟින් වරින් වර නිකුත් කරන වෙනත් රෙගුලාසිවලට යටත් විය යුතුය. පුහුණුව ලබන කාල සීමාව තුළදී ඔවුනට නිවාඩු හෝ නිවාඩු දුම්රිය බලපත් ලැබීමට හිමිකම් නැත.

(ඉ) මෙම පත්වීම් ආධුනික කාලය සම්පූර්ණ කරනු ලදුව II වැනි පන්තිය II ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර විධිමත් පත්වීම් භාරගත් දින සිට අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.

(ඊ) මෙම සේවය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 10-12 දක්වා වගන්තිවල විධිවධාන අදාළ වේ.

(උ) තෝරා ගන්නා ලද අයදුම්කරුවන් වසර 5ක අනිවාර්ය සේවා කාලයක් ඉංජිනේරු සහකාර තනතුරේ සේවය කරන බවට ගිවිසුමකට අත්සන් කළ යුතුය. ඊට පෙර සේවයෙන් ඉවත් වීමට අවශ්‍ය වුවහොත් ගිවිසුමේ සඳහන් මුදල රජයට ගෙවිය යුතුය.

6. අයදුම්කරු අයදුම් පත්‍රය සමඟ පහත දැක්වෙන සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතුය.—

(i) ලබාගෙන ඇති තාක්ෂණික සහතිකයන්,
(ii) අ.පො.ස. (උ. පෙළ) සහතික පත්‍රය,
(iii) අ.පො.ස. (සා. පෙළ) සහතික පත්‍රය,
(iv) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ උප්පැන්න සහතිකය,
(v) මෑතකදී ලබා ගත් චරිත සහතික තුනක් (මින් එක් සහතිකයක් අවසන් වරට ඉගෙන ගත් පාසලේ හෝ විද්‍යාලයේ විදුහල්පතිගෙන් සහ තවත් සහතිකයක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිළධාරියාගෙන් විය යුතුය.)

සටහන - ඉහත සඳහන් සහතිකවල පිටපත් ආපසු දෙනු නොලැබේ.

7. පළාත් සහ රාජ්‍ය සේවාවන් හි නියුතු සේවකයින් ඔවුන්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය.

8. අයදුම්කරුවන් කොළඹ දී පැවැත්වෙන ලිඛිත විභාගයකට සහ සම්මුඛ පරීක්ෂණයකට ඔවුන්ගේම වියදමින් පෙනී සිටිය යුතුය.

9. සේවා අවශ්‍යතාවය මත ඕනෑම අවස්ථාවක දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ඔවුන් සූදානමින් සිටිය යුතුය. දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් වැඩබිම් බොහෝ විට ප්‍රවාහන හා නවාතැන් පහසුකම් අඩු දුෂ්කර ප්‍රදේශවල පිහිටා ඇති බව අයදුම්කරුවන් වටහා ගත යුතුය. තෝරාගන්නා ලද අයදුම්කරුවන් විශේෂයෙන්ම පහත සඳහන් සේවා ස්ථානවලට අනුයුක්ත කරන අතර එම සේවා ස්ථානවල අවම වශයෙන් අවුරුදු 05 ක් සේවය කළ යුතුය. එම සේවා ස්ථානවල සේවය කිරීමට අකමැත්තක් දක්වන අය ඉල්ලුම්පත් ඉදිරිපත් නොකල යුතුය. එම සේවා ස්ථාන අම්පාර, පොතුවිල්, කල්මුණේ, අක්කරපත්තු, පදවිය, රාජාංගනය, හුරුළුවැව, මාපාකඩ, බදුල්ල, කන්දකැටිය, නවකිරි, රුගම්, තිස්ස, වීරකැටිය, හම්බන්තොට, වැල්ලවාය, බිබිල, මොණරාගල, පොළොන්නරුව, කවුඩුල්ල, ඇලහැර , ඉගිනිමිටිය, පුත්තලම, මුතූර්, කන්තලේ, ගෝමරන්කඩවල, මුරුන්කන්, වව්නියාව වැනි වාරිමාර්ග කොට්ඨාශ සහ ව්‍යාපෘති කාර්යාල වේ.

10. අයදුම්පතෙහි සඳහන් කර ඇත්තා වූ යම් අසත්‍ය තොරතුරක් බඳවාගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබීමට ඉඩ තිබේ. එබඳු අසත්‍ය තොරතුරක් බඳවාගනු ලැබීමෙන් අනතුරුව අනාවරණය වුවහොත් ඔහුගේ සේවය අවසන් කෙරෙනු ඇත. මීට අමතරව අසත්‍යය තොරතුරු ඉදිරිපත් කිරීමට එරෙහිව නීති මගින් දඬුවම් ලබා දීමට සිදු වනු ඇත.

11. රජයේ තනතුරුවලට පත් කරගනු ලැබීම සම්බන්ධයෙන් බලපවත්වන රීති සහ රෙගුලාසි සඳහා ශ්‍රී ලංකා රජයේ ගැසට් පත්‍රයේ I කොටසේ II අ ඡේදය කෙරෙහි අවධානය යොමු කෙරේ.

ඉංජි.හද්‍රා කමලදාස,
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

2013 දෙසැම්බර් මස 19 වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
අංක 230, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

අයදුම් පත්‍රය

**වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය**

***වාරිමාර්ග දෙපාර්තමේන්තුව***

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර තනතුර

1. (අ) සම්පූර්ණ නම :—————.
(සිංහලෙන්)
(ආ) සම්පූර්ණ නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(ඇ) මුලකුරු සමග නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.

3. (අ) ලිපිනය :—————.
(සිංහලෙන්)
(ආ) ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(ඇ) ස්ථිර පදිංචි ලිපිනය :—————.
(ඈ) දුරකථන අංකය : නිවස :—————.
ජංගම :—————.
(ඉ) විද්‍යුත් තැපැල් ලිපිනය :—————.

4. පදිංචි දිස්ත්‍රික්කය :—————.

5. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ නම :—————.

6. උපන්දිනයඃ (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න.)

(අ) අවුරුද්ද :———., මාසය :———., දිනය :———.

(ආ) උපන් ස්ථානය :————.

(ඇ) 2014.01.24දිනට වයස ඃ අවුරුදු :———., මාසඃ———., දින :———.

7. ජාතික හැඳුනුම්පත් අංකය :————.

8. ඔබ ශ්‍රී ලාංකිකයෙක්ද ? ඔව්/ නැත ඃ————.

ජාතිය ඃ

| | | | |
|---|---|---|---|
| සිංහල | ☐ | මුස්ලිම් | ☐ |
| ශ්‍රී ලංකා ද්‍රවිඩ | ☐ | වෙනත් | ☐ |
| ඉන්දියානු ද්‍රවිඩ | ☐ | | |

9. අධ්‍යාපනික සුදුසුකම් ඃ (සහතිකවල පිටපත් අමුණන්න)

9.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය ඃ

පළමුවර ඃ

විභාග අංකය :————. අවුරුද්ද :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |

දෙවනවර (අවශ්‍ය නම්) ඃ

විභාග අංකය :————. අවුරුද්ද :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |

9.2 අ.පො.ස. (උසස් පෙළ) විභාගය ඃ

විභාග අංකය :————. අවුරුද්ද :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. ගණිතය | |
| 2. භෞතික විද්‍යාව | |
| 3. | |
| 4. | |

10. තාක්ෂණික සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණන්න.)

……… පාඨමාලාව හා තාක්ෂණ ආයතනයේ නම සඳහන් කරන්න.)

11. ඔබ කලින් රජයේ දෙපාර්තමේන්තුවක හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවය කොට සේවය අතහැර ගියේද / අස් වූයේ ද / සේවය නතර කරනු ලැබුවේ ද / සේවයෙන් පහ කරනු ලැබුවේ ද ? එසේ නම් ඊට හේතු :————.

12. ඔබ දැනට රැකියාවක යෙදී ඇත්නම් ඒ පිළිබඳ විස්තර ඃ

(අ) තනතුර :————.

(ආ) ආයතනය :————.

(ඇ) පත්වීම් ලද දිනය :————.

(ඈ) පත්වීමේ ස්වභාවය (ස්ථිර/තාවකාලික/අනියම්) :————.

13. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත් , නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව හෝ තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මා මෙම තනතුර සඳහා නුසුදුස්සකු බවට පත්වන බවත් , පත් කිරීමෙන් පසු එවැනි දෑ අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මෙයින් දන්වමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය (රජයේ දෙපාර්තමේන්තුවක/ පළාත් රාජ්‍ය සේවයක අයදුම්කරුවන් සඳහා පමණි.)*

…………………… මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු බවත්, ඔහුගේ/ ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, මෙම තනතුරට අයදුම්කිරීම සඳහා නියමිත අවශ්‍යතාවයන් සහ කොන්දේසිවලට අනුකූල බවත්, මම මින් සහතික කරමි. ඔහු/ඇය තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් වැඩිදුරටත් සඳහන් කිරීමට රිසියෙමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

01-143

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට කොන්ත්‍රාත් පදනම මත උප දුම්රිය ස්ථානාධිපතිවරුන් බඳවා ගැනීම

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලබන උප දුම්රිය ස්ථානාධිපති තනතුරු සඳහා පුරප්පාඩු පවතින පහත සඳහන් උප දුම්රිය ස්ථානයන් වෙත මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. තෙල්වත්ත
02. උණවටුන
03. ගම්මාන
04. අරුක්වත්ත
05. ආයෝජන ප්‍රවර්ධන කලාපය
06. තුඩැල්ල
07. බොරලැස්ස
08. කාක්කපල්ලිය
09. පුලිච්චාකුලම
10. රජ්ගම
11. දෙමටගොඩ
12. කඩුගොඩ
13. උඩහමුල්ල
14. බුජ්ජොමුව
15. පැඟිරිවත්ත
16. බත්තුළුඔය
17. කතළුව
18. සරසවි උයන
19. හොරිවිල
20. උඩත්තාවල
21. කන්දෙගොඩ
22. හෙට්ටිමුල්ල
23. එළුතුමට්ටුවාල්
24. මිරුසුවිල්
25. නාවින්න
26. හබරාදූව
27. මිසාලෙයි
28. සන්කත්තානෙයි
29. තච්චන්තෝප්පු
30. පුන්ගන්කුලම්
31. කොකුවිල්
32. ඉණුවිල්
33. මල්ලාකම්
34. තෙල්ලිපලෙයි
35. මාවිත්තපුරම්
36. මාතෝට්ටම්
37. තිරුක්තීස්වරම්
38. තෝඩ්ඩවෙලි
39. අනුරාධපුර නව නගරය
40. කඩදාසි නගරය
41. තුම්මෝදර
42. වළකුඹුර
43. දේවපුරම්
44. පැරකුම්පුර
45. මගලේගොඩ
46. උතුරු පයාගල
47. හතරැස් කොටුව
48. ආඳාදොළ
49. පූනැව
50. ආරච්චිකට්ටුව
51. කොටා පාර
52. අහුංගල්ල
53. කිතල්ඇල්ල
54. කුමාරකන්ද
55. අකුරළ
56. කොස්හින්න
57. පනලිය
58. පැරකුම්උයන
59. විල්වත්ත
60. දාරළුව
61. පල්ලෙතලවින්න
62. මහඉඳුරුව
63. පනාගොඩ
64. මානුවන්ගම
65. පින්නවල
66. කොරළවැල්ල
67. මැදගම
68. උග්ගල්ල
69. නෙළුම්පොකුණ
70. සවරාණ
71. මීගම්මන

01. *උප දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ රාජකාරී විස්තර .—*
ප්‍රවේශපත්‍ර අලෙවි ස්ථාන භාරව සේවයේ යොදවනු ලබන නියෝජිතවරුන් ඒ ඒ ස්ථානයේ නවත්වනු ලබන දුම්රිය අනුව පැය 24 පුරාම ප්‍රවේශපත්‍ර අලෙවි කිරීම, පාර්සල් භාරගැනීම හා ලැබෙන පාර්සල් අයිතිකරුවන්ට භාරදීම, දවසේ එකතුවන මුදල් ප්‍රධාන දුම්රිය ගණකාධිකාරිවරයාට ප්‍රේෂනය කිරීම එම ස්ථානය පිරිසිදුව තබාගැනීම හා දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා විසින් අවස්ථානුකූලව පවරනු ලබන වෙනත් රාජකාරි ද මෙම නියෝජිතවරුන්ගේ සාමාන්‍ය රාජකාරි වේ.

02. *දීමනා.—*
ස්ථිර සේවක සංඛ්‍යාවට අයත් නොවන තනතුරකි. තෝරාගනු ලබන අයවළුන්ට ඒ ඒ ස්ථානයේ ආදායම් පදනම් කරගත් කොමිස් මුදල් හා අනුමත දීමනා පමණක් ගෙවනු ලැබේ. තව ද අවම කොමිස් මුදල රු. 310 ක් වන අතර, කොමිස් මුදලට අමතරව රු. 5,329 ක දීමනාවක් හිමි වේ.

03. අයදුම් කළ හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණක් වන අතර, එක් අයදුම්කරුවෙකු තම අයදුම්පතෙහි ඉල්ලුම් කළ හැක්කේ එක් උප දුම්රිය ස්ථානයක් පමණි. එකකට වඩා වැඩියෙන් සඳහන් කර ඇති අවස්ථාවල දී පළමුවෙන් සඳහන් කර ඇති උප දුම්රිය ස්ථානය ඉල්ලුම්කර ඇතිසේ සලකනු ලැබේ.

04. *වයස් සීමාව.*—අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2014.02.03 දිනට) වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය.

05. *අධ්‍යාපන සුදුසුකම්.*—අ.පො.ස. (සා/පෙ) විභාගයෙන් සිංහල/දෙමළ/ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ හතරක් සහිතව විෂයයන් 06කින් එකවර සමත් විය යුතු ය.

06. *වෙනත් සුදුසුකම්.—*

(i) ඉල්ලුම්කරු අදාළ උප දුම්රිය ස්ථානයේ සිට කිලෝමීටර් 20 ක් ඇතුළත (සෘජු දුර) ආසන්න දුර සීමාවේ වසර 05ක ස්ථිර පදිංචි කරුවෙකු විය යුතු ය. අනුයුක්ත කිරීමේ ලිපිය ප්‍රදානය කිරීමට පෙර මේ බව පිළිගත හැකි ලිපිවලින් සනාථ කළ යුතු ය. (ග්‍රාම නිලධාරි සහතිකය, ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය, ඡන්ද නාම ලේඛනයේ පිටපතක් ආදී වශයෙන්) අයදුම්පතෙහි සඳහන් කරනු ලබන ලිපිනය ස්ථිර ලිපිනය විය යුතු අතර දුම්රිය ස්ථානයට ඇති සෘජු දුර ගණනය කළ යුත්තේ එම ස්ථානයේ සිටය.

(ii) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.

(iii) උස 5" 4" කට හා පපුව 32" කට නොඅඩු වීම.

(iv) උපදුම්රිය ස්ථානාධිපතිවරයෙකු වශයෙන් දැනට සේවය කරනු ලබන හෝ එසේ සේවය කර සේවය අවසන් කරන ලද අයවළුන්ට මේ සඳහා ඉල්ලුම් කිරීමට හිමිකම් නැත.

(v) තෝරාගනු ලබන්නන් යහපත් ශාරීරික සෞඛ්‍ය තත්ත්වයකින් හා අක්ෂි දෘෂ්ඨිය යහපත් තත්වයේ ඇති බවට තහවුරු කර ගැනීමෙන් පසුව වේ. සුදුසුකම් හා හොඳ ඇස් පෙනීමක් ඇති අයෙකු වීම අනිවාර්යය වේ.

07. *තෝරා ගැනීමේ ක්‍රමය* :

දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ කුසලතාවය මත තෝරාගනු ලැබේ. ඒ අනුව පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ දී සියලුම අයදුම්කරුවන් පහත දක්වන විෂයයන් යටතේ ප්‍රශ්න පත්‍ර 02කට පිළිතුරු සැපයිය යුතුවේ. විභාගයෙන් සුදුසුකම් ලැබීම සඳහා එක් විෂයයකින් අවම වශයෙන් 40%ක් බැගින් ලකුණු ලබාගත යුතුවේ.

(i) භාෂා හැකියාව :
කාලය පැය 01 යි - මුළු ලකුණු 100 යි.
අවබෝධය හා නිවැරදි බස හැසිරවීම පිළිබඳ විෂයානුබද්ධ ප්‍රශ්න ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි.

(ii) බුද්ධි පරීක්ෂණය :
කාලය පැය 01 යි. - මුළු ලකුණු 100යි.

ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතු ගණිත ගැටලු, භාෂා ඛණ්ඩ, වගු ගැලපීම් සටහන් පින්තූර, ප්‍රස්ථාර ඇසුරෙන් තර්කානුකූල ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව සහිත විචාර බුද්ධිය මැන බැලීමේ බහුවරණ ක්‍රමයේ ප්‍රශ්න පත්‍රයකි.

*සටහන*.-

(i) තරග විභාගයෙන් සුදුසුකම් ලැබූ අය අතරින් ඒ ඒ ප්‍රවේශපත්‍ර අලෙවි ස්ථානය අනුව, වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරු අදාළ ප්‍රවේශපත්‍ර අලෙවි ස්ථානය සඳහා පත් කිරීමට සලකා බැලීම පිණිස සුදුසුකම් පරීක්‍ෂා කිරීමේ සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලැබේ.

(ii) සම්මුඛ පරීක්‍ෂණයේ දී ලකුණු දීමක් සිදු නොවේ.

(iii) සුදුසුකම් ලැබූවන් සම ලකුණු ලබා සිටියහොත් එවැනි අවස්ථාවල දී දුම්රිය ප්‍රවේශපත්‍ර අලෙවි නියෝජිතවරයා යටතේ හෝ උප දුම්රිය ස්ථානාධිපතිවරයා යටතේ අනුමත ආදේශකයෙකු වශයෙන් සේවය කර ඇති අයදුම්කරුවාට අවස්ථාව දෙනු ලැබේ. එසේ නොවන්නේ නම් අදාළ ප්‍රවේශපත්‍ර අලෙවි ස්ථානයේ සිට වඩාත්ම ආසන්න පදිංචිකරුවා තෝරාගනු ලැබේ.

08. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි*.—

(අ) තෝරාගනු ලබන අය විසින් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් තීරණය කරනු ලබන පරිදි හෝ අවම වශයෙන් රු. 25,000 ක මුදලක් ආරක්‍ෂක ඇපයක් වශයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරිවරයාගේ නමට තැන්පත් කළ යුතු අතර, දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා සමග අත්සන් කරනු ලබන ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර කටයුතු කළ යුතු වේ. එම ගිවිසුමේ කොන්දේසි කඩකිරීම සේවය අවසන් කිරීමට හේතුවක් වනු ඇත.

(ආ) මෙය කොන්ත්‍රාත් පදනමක් වන අතර, අවුරුද්දක් පාසා අදාළ ගිවිසුම අලුත් කළ යුතු ය. එසේ අලුත් නොකරනු ලබන අවස්ථාවේ දී ගිවිසුම අහෝසි වනු ඇත.

(ඇ) තෝරාගනු ලබන අයදුම්කරු තමා අනුයුක්ත කරනු ලබන ස්ථානයේ රාජකාරි පිළිබඳව දින 14ක පුහුණුවක් දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා නියම කරනු ලබන දුම්රිය ස්ථානයකින් ලබාගත යුතුවේ. මෙම පුහුණු කාලය සඳහා කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

(ඈ) තමා වෙනුවට සහායට වැඩ කිරීමට දුම්රිය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව තමන්ට සහායකයෙකු අනුමත කරවාගත හැකිවන අතර ආදේශකවරයා වෙනුවෙන් කිසිදු දීමනාවක් දෙපාර්තමේන්තුව විසින් ගෙවනු නොලැබේ. ස්ථානයේ සම්පූර්ණ වගකීම උප දුම්රිය ස්ථානාධිපතිවරයා සතු ය.

(ඉ) පුහුණුව ලබන කාලය තුළ හෝ උප දුම්රිය ස්ථානාධිපති වශයෙන් කටයුතු කරමින් සිටින කිසියම් අවස්ථාවක දී හෝ සම්මුඛ පරීක්‍ෂණයට හෝ වෙනත් කිසියම් අවස්ථාවක දී හෝ අපේක්‍ෂකයා විසින්/ඔහු වෙනුවෙන් ලබාදී ඇති/සපයා ඇති තොරතුරු නිවැරදි සහ බල සහිත ඒවා නොවේ යැයි හෙළි වුවහොත් කිසිදු පූර්ව දැනුම් දීමකින් හා වන්දි ගෙවීමකින් තොරව වහාම ක්‍රියාත්මක වන පරිදි ඔබගේ සේවය ලබාගැනීම අවසන් කරනු ලැබේ.

(ඊ) උප දුම්රිය ස්ථානාධිපති ලෙස තෝරා ගන්නා අයෙකුට එම තේරීම මත දුම්රිය දෙපාර්තමේන්තුවේ කිසිදු ස්ථිර තනතුරක් ලබා දීමට දෙපාර්තමේන්තුව බැඳී නොමැත.

09. *සේවා කොන්දේසි*.—

(i) අත්සන් කරනු ලබන ගිවිසුමේ යම් කොන්දේසියක් හෝ කීපයක් හෝ කඩකළහොත් ඔහුගේ පත්වීම වහාම ක්‍රියාත්මක වන පරිදි අවසන් කරනු ලැබේ.

(ii) දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා විසින් කලින් කලට පනවනු ලබන විධිවිධාන හා රෙගුලාසිවලට ද යටත්වීමට එකඟවිය යුතු ය.

10. *විභාග ගාස්තු*.—

සියලුම අයදුම්කරුවන් ආපසු නොගෙවන රු. 500 ක මුදලක් දුම්රිය සාමාන්‍යාධිකාරී නමට ගෙවන කාර්යාලය, මරදාන, තැපැල් කාර්යාලය යනුවෙන් සඳහන් කර ලබාගත් මුදල් ඇණවුම අයදුම්පත සමග අමුණා එවිය යුතු ය. වෙනත් ක්‍රම වලින් විභාග ගාස්තු ගෙවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත. අසම්පූර්ණ හෝ අවිධිමත් අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් තමන්ගේ අනන්‍යතාවය විභාග මධ්‍යස්ථානයේ දී ඔප්පු කළ යුතු ය.

11. *අයදුම්පත් ඉදිරිපත් කිරීම*.—

යතුරුලියන කඩදාසි ප්‍රමාණයේ (ඒ-4) අයදුම්කරුවා විසින්ම අයදුම්පත සකස් කරගත යුතු අතර, අයදුම්පත බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස උඩ කෙලවරේ "උප දුම්රිය ස්ථානාධිපති විභාග අයදුම්පත්‍රය - ඉල්ලුම් කරන දුම්රිය ස්ථානය" යනුවෙන් සඳහන් කර දුම්රිය සාමාන්‍යාධිකාරී තැ. පෙ. 355, දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය, කොළඹ 10 යන ලිපිනයට 2014.02.03 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (ආදර්ශ අයදුම්පත්‍රය පහත පරිදි වේ.)

12. *අයදුම්පත සහතික කිරීම*.—

ඉල්ලුම් පත්‍රයේ ඇති අයදුම්කරුවාගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චයකරුවෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ වර්ෂයකට රු. 2,37,060 කට නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් හෝ සහතික කරනු ලැබිය යුතු ය.

බී. ඒ. පී. ආරියරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2013 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ 10,
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී ය.

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් පදනම මත උප දුම්රිය ස්ථානාධිපති තනතුර සඳහා වූ අයදුම්පත**

01. අයදුම්කරන උප දුම්රිය ස්ථානය : [ ]

(i) සම්පූර්ණ නම :————.
(ii) මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
(iii) මුලකුරු සමග නම (ඉංග්‍රීසියෙන්) :————.

02. ස්ථිර ලිපිනය :

(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.
(iii) දුරකතන අංකය (නිවස) :————. (ජංගම) :————.

03. (i) උපන් දිනය :
2014.02.03 වැනි දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐
(ii) උස :————.
(iii) පපුව :————.

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

05. දිස්ත්‍රික්කය : ☐

06. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ☐ ග්‍රාම නිලධාරී කොට්ඨාසය : ☐

07. ඔබගේ ස්ථිර පදිංචි ස්ථානයේ සිට ඔබ ඉල්ලුම් කරන උප දුම්රිය ස්ථානයට ඇති දුර ප්‍රමාණය (සෘජු දුර) කි. මී. වලින් දක්වන්න. :————.

08. අධ්‍යාපන සුදුසුකම් :
අ. පො. ස. (සා/පෙළ)

| වර්ෂය හා විභාග අංකය | විෂයයන් | සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

09. වෙනත් සුදුසුකම් :————.

10. ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) :
☐

11. ඔබ කිසියම් චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේනම් ඒ පිළිබඳ විස්තර දක්වන්න. :————.

12. ........................... තැපැල් කාර්යාලයට රු. 500ක් ගෙවා ලබාගත් අංක ........................ දරන මුදල් ඇණවුමේ මුල් පිටපත මේ සමග අමුණා එවමි. (වෙනත් ක්‍රමවලින් විභාග ගාස්තු ගෙවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත.)

13. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික වෙමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය හා වැරදි සහගත බව මා පත් කරනු ලැබීමට පෙර සොයාගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු වන බවටත් පත්වීම් ලැබීමෙන් පසුව අනාවරණය වුවහොත් මගේ සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන, ජාතික හැඳුනුම්පත් අංක ..................... දරන .................. මහතා මා පෞද්ගලිකව දන්නා බවත්, ඔහු අද දින මා ඉදිරිපිට දී ඔහුගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

(නිල මුද්‍රාව තබන්න)

01-98

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## *උපලේඛනය*

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2014** | | | |
| ජනවාරි | 2014.01.03 | සිකුරාදා | 2013.12.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.01.10 | සිකුරාදා | 2013.12.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.01.17 | සිකුරාදා | 2014.01.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.01.24 | සිකුරාදා | 2014.01.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.01.31 | සිකුරාදා | 2014.01.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2014.02.07 | සිකුරාදා | 2014.01.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.02.13 | බ්‍රහස්පතින්දා | 2014.01.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.02.21 | සිකුරාදා | 2014.02.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.02.28 | සිකුරාදා | 2014.02.13 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| මාර්තු | 2014.03.07 | සිකුරාදා | 2014.02.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.03.14 | සිකුරාදා | 2014.02.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.03.21 | සිකුරාදා | 2014.03.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.03.28 | සිකුරාදා | 2014.03.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ජී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.